# ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 37 දරන මුදල් නීති (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1974 ඔක්තෝබර් මස 14 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1974 ඔක්තෝබර් මස        වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

# ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 37 දරන මුදල් නීති (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1974 ඔක්තෝබර් මස 14 වන දින]

එල්. ඩී.—ඕ. 40/69.

**මුදල් නීති පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 37 දරන මුදල් නීති (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන දිනයක එය ක්‍රියාත්මක වන්නේ ය. *(ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.)*

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) මුදල් නීති පනතේ 8 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :— *(422 වන අධිකාරයේ 8 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.)*

*("මුදල් මණ්ඩලයේ සංයුතිය.)*

8. (1) මේ පනත යටතේ සම්මත කර ගැනීමට බලය දෙනු ලැබූ ප්‍රතිපත්ති හෝ ගැනීමට බලය දෙනු ලැබූ පියවර නිශ්චය කිරීමේ කාර්යයට අතිරේකව මේ පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ බලතල, කාර්යයන් හා කටයුතු ද ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය සතු විය යුතු අතර බැංකුවේ කළමනාකරණය, කටයුතු හා පරිපාලනය සම්බන්ධයෙන් එම මණ්ඩලය සාමාන්‍යයෙන් වගකිව යුතු ය.

(2) මුදල් මණ්ඩලය පහත සඳහන් තැනැත්තන් ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති; ඔහු මණ්ඩලයේ සභාපති විය යුතු ය ;

(ආ) මුදල් විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් තත් කාලයෙහි ධුරය දරන තැනැත්තා ;

(ඇ) ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් තත් කාලයෙහි ධුරය දරන තැනැත්තා ; සහ

(ඈ) අග්‍රාමාත්‍යවරයාගේ නිර්දේශය පිට ජනාධිපතිවරයා විසින් පත්කරනු ලබන හතර වන සාමාජිකයෙක්.

(3) මුදල් මණ්ඩලයේ යම් රැස්වීමකට බැංකුවේ අධිපති පැමිණ නොසිටියහොත් මණ්ඩලය විසින් ජ්‍යෙෂ්ඨයා වශයෙන් නාමෝද්දිෂ්ට නියෝජ්‍ය

අධිපති ඔහු වෙනුවට ක්‍රියා කළ යුතු ය. ඔහු ඒ රැස්වීමේ මූලාසනය දැරිය යුතු අතර එහි දී ඡන්දය දීමේ අයිතිය ඔහුට ඇත්තේ ය.

(4) මුදල් මණ්ඩලයේ යම් රැස්වීමකට (2) වන උපවගන්තියේ (ආ) ඡේදයෙහි සඳහන් සාමාජිකයා පැමිණ නොසිටියහොත් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වශයෙන් තත් කාලයෙහි ධුරය දරන තැනැත්තා ඒ සාමාජිකයා වෙනුවට ඒ රැස්වීමේ දී ක්‍රියා කළ යුතු අතර එහි දී ඡන්දය දීමේ අයිතිය ඔහුට ඇත්තේ ය.

(5) මුදල් මණ්ඩලයේ යම් රැස්වීමකට (2) වන උපවගන්තියෙහි (ඇ) ඡේදයෙහි සඳහන් සාමාජිකයා පැමිණ නොසිටියහොත් ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට වැඩ බැලීමට පත් කරනු ලැබ සිටින නිලධරයා ඒ සාමාජිකයා වෙනුවට ඒ රැස්වීමේ දී ක්‍රියා කළ යුතු අතර එහි දී ඡන්දය දීමේ අයිතිය ඔහුට ඇත්තේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"බැංකුවේ අධිපති වශයෙන් හෝ මුදල් මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීම සම්බන්ධයෙන් නුසුදුසුකම.

11. යම් තැනැත්තෙක්—

(අ) මහජන මන්ත්‍රීවරයෙක් නම් හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයෙක් නම්; හෝ

(ආ) ශ්‍රී ලංකා ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අර්ථානුකූල රාජ්‍ය නිලධරයෙක් හෝ විනිශ්චයකාරවරයෙක් නම් හෝ ජනරජයේ අරමුදල්වලින් හෝ යම් පළාත් පාලන ආයතනයක අරමුදල්වලින් වැටුප් හෝ අන් පාරිශ්‍රමික ගෙවනු ලබන (ශාස්ත්‍රීය තත්ත්වයක් නොවන) යම් ධුරයක් හෝ තත්ත්වයක්, එයට තෝරා පත්කර ගනු ලැබීමෙන් හෝ පත් කරනු ලැබීමෙන් දරන්නේ නම්; හෝ

(ඇ) (ශ්‍රී ලංකා මහ බැංකුව නොවන) යම් බැංකු ආයතනයක අධ්‍යක්ෂවරයෙක්, නිලධරයෙක්, සේවකයෙක් හෝ කොටස් කරුවෙක් නම්

ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති වශයෙන් හෝ 8(2) වන වගන්තියේ (ඇ) ඡේදය යටතේ මුදල් මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් හෝ පත් කරනු ලැබීමට ඔහු නුසුදුස්සෙක් වන්නේ ය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

' බැංකුවේ අධිපතිගේ හා පත් කරන ලද සාමාජිකයාගේ ධුර කාලය.

13. (1) බැංකුවේ අධිපතිගේ හා 8 (2) වන වගන්තියේ (ආ) ඡේදය යටතේ පත් කරනු ලැබූ (මෙහි මින් මතු "පත් කරන ලද සාමාජිකයා" යනුවෙන් සඳහන් කරනු ලබන) තැනැත්තාගේ ධුර කාලය මේ වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, ඔහුගේ පත්වීමේ දිනයෙන් ආරම්භ වන අවුරුදු හයක කාලය වන්නේ ය :

එසේ වුව ද, මේ පනත යටතේ ධුරය දරන, ප්‍රථම පත් කරන ලද සාමාජිකයාගේ ධුර කාලය ඔහුගේ පත්වීමේ දින සිට අවුරුදු තුනක කාලය වන්නේ ය.

(2) තම ධුර කාලය ඉකුත්වීමට පෙර බැංකුවේ අධිපති විසින් හෝ පත් කරන ලද සාමාජිකයා විසින් ධුරය හිස් කරනු ලැබුවහොත් එසේ ධුරය හිස් කරන බැංකු අධිපතිගේ හෝ සාමාජිකයාගේ ධුර කාලයෙන් ගත නොවුණු කොටස තුළ ධුරය දැරීමට ඔහු වෙනුවට වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

(3) කාලය ඉකුත්වීමෙන් බැංකුවේ අධිපති වශයෙන් හෝ පත් කරන ලද සාමාජිකයා වශයෙන් හෝ ධුරය හිස් කරන යම් තැනැත්තෙක් නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් වන්නේ ය.'.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියේ (2) වන උප වගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් උප වගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(2) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින්, අග්‍රාමාත්‍යවරයා විමසා, ඒ දීමනාවේ ප්‍රමාණය නියම කළ යුතු ය.".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"මුදල් මණ්ඩලයේ රැස්වීම්.

17. (1) මුදල් මණ්ඩලයේ රැස්වීම් යටත් පිරිසෙයින් සෑම සති දෙකකට වරක් ද ඊට අමතරව මේ පනත යටතේ මුදල් මණ්ඩලයේ වගකීම් ඉටු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වන විටින් විට ද පැවැත්විය යුතු ය.

(2) මණ්ඩලයේ රැස්වීම් මහ බැංකුවේ අධිපති විසින් කැඳවිය යුතු ය.

(3) මණ්ඩලයේ කවර රැස්වීමක වුව ද ගණ පූරණය සාමාජිකයන් තිදෙනකු විය යුතු ය.

(4) මණ්ඩලයේ යම් රැස්වීමක දී ගත් කිසිදු තීරණයක් ඒ තීරණයට යටත් පිරිසෙයින් සාමාජිකයන් තිදෙනකුගේ එකඟත්වය ඇත්තේ නම් මිස නැතහොත් මේ පනතේ වෙනත් යම් විධිවිධානයකින් ඒකමතික තීරණයක් නියම කෙරෙන යම් අවස්ථාවක දී සාමාජිකයන් හතරදෙනාගේ ම එකඟත්වය ඇත්තේ නම් මිස මණ්ඩලයේ තීරණයක් ලෙස සලකනු නොලැබිය යුතු ය.”.

32අ, 32ආ, 32ඇ, 32ඈ සහ 32ඉ වන අලුත් වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 32 වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්ති මෙසින් ඇතුළත් කරනු ලබන අතර ඒවා එහි 32අ, 32ආ, 32ඇ, 32ඈ සහ 32ඉ වන වගන්ති වශයෙන් බල පැවැත්විය යුතු ය :—

“ බැංකු ආයතන සහ සමුපකාර සමිති විසින් දරනු ලබන තැන්පතු රක්ෂණය කිරීමේ යෝජනා ක්‍රමය.

32අ. බැංකු ආයතන ද සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ සමිති ද විසින් දරනු ලබන තැන්පතු රක්ෂණය කිරීම සඳහා වූ යෝජනා ක්‍රමයක්, මුදල් මණ්ඩලය විසින් කලින් කල නිශ්චය කරනු ලබන පරිදි පිහිටුවීම, පවත්වා ගෙන යාම, කළමනාකරණය හා පාලනය කිරීම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කළ හැකි ය.

බැංකු ආයතන හෝ සමිති විසින් දරනු ලබන තැන්පතු රක්ෂණය කිරීම.

32ආ. (1) යම් බැංකු ආයතනයක් විසින් හෝ සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කරන ලද්දා වූ ද ඕනෑම වර්ගයක බැංකු ව්‍යාපාරයක් පවත්වා ගෙන යන්නා වූ ද යම් සමිතියක් විසින් හෝ දරනු ලබන තැන්පතු රක්ෂණය කිරීම පිණිස එම ආයතනය හෝ සමිතිය විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත නියමිත පරිදි ඉල්ලුම් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ යම් ඉල්ලීමක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ස්වකීය අභිමතය අනුව පිළිගත හැකි ය.

(3) ස්වකීය ඉල්ලීම (2) වන උපවගන්තිය යටතේ පිළිගනු ලැබ ඇති සෑම බැංකු ආයතනයක් ම හෝ සමිතියක් ම අවස්ථාවෝචිත පරිදි “ රක්ෂිත බැංකුව ” හෝ “ රක්ෂිත සමිතිය ” යනුවෙන් මින් මතු මේ පනතේ මේ කොටසෙහි හඳුන්වනු ලැබේ.

තැන්පතු සඳහා ගෙවිය යුතු වාරික.

32ඇ. (1) සෑම රක්ෂිත බැංකුවක් ම හෝ රක්ෂිත සමිතියක් ම අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව මුදල් මණ්ඩලය විසින් කලින් කල නිශ්චය කරනු ලබන පදනමක් මත ස්වකීය තැන්පතු සඳහා වූ වාරිකයක් ශ්‍රී ලංකා මහ බැංකුවට ගෙවීමට යටත් විය යුතු ය :

එසේ වුව ද, යම් කාලයක් සඳහා යම් රක්ෂිත බැංකුවක් විසින් හෝ රක්ෂිත සමිතියක් විසින් හෝ ගෙවිය යුතු වාරිකය ඒ බැංකුවෙහි හෝ සමිති

යෙහි ඇති තැන්පතුවල මුළු මුදලේ සෑම රුපියල් සියයකට අවුරුද්දකට සත පහළොවක් නොඉක්ම විය යුතු ය.

(2) මුදල් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන කාල සීමාවන් සඳහා ද එසේ නිශ්චය කරනු ලබන අවස්ථාවලදී හා ආකාරයෙන් ද වාරිකය ගෙවිය යුතු ය.

(3) යම් වාරිකයක් සම්බන්ධයෙන් රක්ෂිත බැංකුවක් හෝ රක්ෂිත සමිතියක් විසින් යම් ගෙවීමක් නොකර හරින ලද නම් මුදල් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ප්‍රමාණයක් අනුව ඒ වාරිකයෙහි මුදල සඳහා ඒ පැහැර හැරීමේ කාල සීමාව සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවට පොලියක් ගෙවීමට ඒ බැංකුව හෝ සමිතිය යටත් වන්නේ ය.

රක්ෂිත බැංකු සහ රක්ෂිත සමිති පරීක්ෂා කිරීම ආදිය.

32ආ. (1) බැංකු පරිපාලන අධ්‍යක්ෂ විසින් සිය අභිමතය අනුව යම් රක්ෂිත බැංකුවක හෝ රක්ෂිත සමිතියක පොත් හා ගිණුම් පරීක්ෂා කිරීම හෝ ස්වකීය කාර්යාංශයේ පරීක්ෂකයකු ලවා පරීක්ෂා කරවීම හෝ කළ හැකි ය.

(2) මේ පනතෙහි 29 වන වගන්තියේ (4) වන හා (5) වන උපවගන්තිවල සහ 30 වන වගන්තියෙහි, 31 වන වගන්තියෙහි හා 32 වන වගන්තියෙහි ද විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව රක්ෂිත බැංකුවලට හා රක්ෂිත සමිතිවලට අදාළ වන්නේ ය.

නියෝග.

32ඉ. පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය විසින් නියෝග සෑදිය හැකි ය :—

(අ) වාරික ගණන් බලනු ලබන කාලපරිච්ඡේද යන්, වේලාවන් හා ආකාරය හා රක්ෂිත බැංකුවක් හෝ රක්ෂිත සමිතියක් විසින් ඒවා ගෙවනු ලැබිය හැකි කාලපරිච්ඡේද යන්, වේලාවන් හා ආකාරය ;

(ආ) වාරික ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක රක්ෂිත බැංකුවකින් හෝ රක්ෂිත සමිතියකින් අය කරනු ලැබිය හැකි පොලිය ;

(ඇ) සඳහන් කොට ඇති හෝ නියම කිරීමට නියමිත යම් කරුණක් හෝ මේ පනතේ මේ කොටස යටතේ නියෝගයක් සෑදීමට බලය දෙනු ලැබ ඇති යම් කරුණක් ; සහ

(ඇ) මේ පනතේ මේ කොටස යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ බලතල, කටයුතු හා කාර්ය යන් ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම කෙරෙහි බලපාන, ඒවාට සම්බන්ධ හෝ ආනුෂංගික වෙනත් යම් කරුණක්.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(1) ශ්‍රී ලංකා මහ බැංකුවේ තත්ත්වය පිළිබඳ වාර්ෂික වාර්තා වක් හා මුදල් මණ්ඩලය විසින් මුදල් වර්ෂය තුළ දී අනුගමනය කළ ප්‍රතිපත්ති හා ගනු ලැබූ පියවර පිළිබඳ සමාලෝචනයක් හා ඒ ප්‍රතිපත්ති අනුගමනය කිරීමට හා ඒ පියවර ගැනීමට තුඩු දුන් ආර්ථික හා මූල්‍යමය හේතූන් පිළිබඳ විග්‍රහයක් එක් එක් මුදල් වර්ෂය අවසන් වීමෙන් පසු මාස හතරක් ඇතුළත මුදල් මණ්ඩලය විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කොට ඒවා පළ කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:—

'රහස්‍යතාව රැක ගැනීමේ යුතුකම.

45. (1) ශ්‍රී ලංකා මහ බැංකුවේ සෑම නිලධරයකු ම හෝ සේවකයකු ම විසින්, ස්වකීය කාර්යයන් ඉටු කිරීමෙහි දී තමාට දැන ගැනීමට ලැබෙන යම් බැංකු ආයතනයක හෝ එවැනි යම් ආයතනයක යම් සේවා දායකයකුගේ කටයුතුවලට අදාළ සියලු කරුණු සම්බන්ධයෙන් මේ පනත යටතේ ස්වකීය කාර්යයන් ඉටු කිරීමෙහි දී හැර රහස්‍යතාව රැකිය යුතුවාක් මෙන් ම එසේ රහස්‍යතාව රැකීමෙහි ලා ආධාර කළ යුතු ය; තව ද මුදල් මණ්ඩලයට හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති විසින් ඒ සඳහා බලය දෙනු ලැබූ ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධරයකු නොවන අන් තැනැත්තකුට එවැනි යම් කරුණක් දන්වන හෝ යම් බැංකු ආයතනයකට අදාළ පොත්, ලිපි හෝ වෙනත් වාර්තා කිසිවක් බලා ගැනීමට යම් බලය නොලත් තැනැත්තකුට ඉඩ දෙන හෝ අවසර දෙන යම් නිලධරයකු හෝ සේවකයකු වරදකරුවකු විය යුතු ය.

(2) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි පරිදි හැර, යම් පොතක් හෝ ලේඛනයක් යම් අධිකරණයක දී ඉදිරිපත් කරන ලෙස හෝ මේ පනත යටතේ ස්වකීය කාර්යයන් ඉටු කිරීමෙහි දී තමාට දැන ගන්නට ලැබෙන යම් කරුණක් හෝ දෙයක් යම් අධිකරණයකට එළිදරව් කරන ලෙස හෝ දන්වන ලෙස, ශ්‍රී ලංකා මහ බැංකුවේ කිසිම නිලධරයකුට හෝ සේවකයකුට නියම නොකළ යුතු ය.

(3) ශ්‍රී ලංකා මහ බැංකුවේ යම් පොතක හෝ ලේඛනයක සහතික පිටපතක් හෝ ඒ පොතෙහි හෝ ලේඛනයෙහි යම් සටහනක සහතික පිට පතක් යම් නඩු කටයුත්තක දී ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි ඒ පොත, ලේඛනය හෝ සටහන පවතින බවට මුල් බැල්මට පෙනෙන සාක්ෂ්‍යය වශයෙන් ඒ සහතික පිටපත පිළිගත යුතු අතර ඒ මුල් පොත, ලේඛනය හෝ සටහන නීතිය අනුව පිළිගත හැකි සෑම අවස්ථාවක දීම හා එසේ පිළිගත හැකි ප්‍රමාණයට ම එහි වාර්තාගත වී ඇති කරුණු, ගණුදෙනු හෝ ගණන් පිළිබඳ සාක්ෂ්‍යය වශයෙන් එය ආවේශ්‍ය විය යුතු නමුත් ඊට වැඩි වශයෙන් හෝ අන්‍යාකාරයකින් එසේ ආවේශ්‍ය නොවිය යුතු ය.

මේ උපවගන්තියෙහි "සහතික පිටපත" යන්න යම් පොතක්, ලේඛනයක් හෝ සටහනක් සම්බන්ධයෙන් යෙදෙන විට ඒ පිටපත ඒ පොතේ, ලේඛනයේ හෝ සටහනේ සත්‍ය පිට පතක් බවට ද ඒ පොත හෝ ලේඛනය එවකට ශ්‍රී ලංකා මහ බැංකුව භාරයෙහි තිබෙන බවට ද ඒ සටහන ශ්‍රී ලංකා මහ බැංකුවේ සාමාන්‍ය පොත් වලින් එකක ඇතුළත්ව ඇති බවට හා සිරිත් පරිදි සාමාන්‍ය ව්‍යාපාර කටයුතු කිරීමෙහි දී ඒ සටහන කළ බවට ද ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති විසින් ඒ කාර්යය සඳහා බලය දෙනු ලැබූ යම් නිලධර යකු විසින් ඒ පිටපතේ අගට තම නම, නිල නාමය හා දිනය යොදා කරන ලද ලිඛිත සහතික යක් සමග වූ ඒ පොතේ, ලේඛනයේ හෝ සට හනේ පිටපතක් ඉන් අදහස් වේ.'.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 108 වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය එම ප්‍රඥප්තියේ 108අ වන වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :— 108අ වන අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

'සුළු පරිමාණ ව්‍යවසායයන්ට ලැබෙන ණය සඳහා ඇපවීම.

108අ. (1) ශ්‍රී ලංකාවෙහි කටයුතු කරන ණය දෙන ආයතන විසින් සුළු පරිමාණ ව්‍යවසායයන්ට දෙනු ලබන ණය, අත්තිකාරම් හෝ වෙනත් පහසු කම් සඳහා ඇපවීම, මුදල් මණ්ඩලය විසින් කලින් කල කරනු ලබන් විධානවලට යටත්ව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කළ හැකි ය.

(2) ණය දෙන ආයතන විසින් සුළු පරිමාණ කාර්මික ව්‍යවසායයන්ට දෙන ලද ණය, අත්තිකාරම් හෝ වෙනත් පහසුකම් කිසිවක් සඳහා මේ වගන්තිය ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව සහ ආණ්ඩුවේ අනුයෝජිතයා වශයෙන් හෝ ආණ්ඩුව වෙනුවෙන් හෝ ක්‍රියා කරමින් ශ්‍රී ලංකා මහ

බැංකුව විසින් 108 වන වගන්තිය යටතේ ඇප වී තිබෙන අවස්ථාවක, ඒ ඇපවීම ඒ දිනයේ සිට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එම බැංකුව වෙනුවෙන් ම කරනු ලැබූ ඇපවීමක් වශයෙන් සැලකිය යුතු ය.

(3) මේ වගන්තියෙහි "ණය දෙන ආයතනය" යන්නෙන් මේ පනතේ 127 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි අර්ථකථනය කර ඇති යම් බැංකු ආයතනයක් අදහස් වන අතර—

(අ) ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනත යටතේ පිහිටුවන ලද ලංකා සංවර්ධන මුදල් සංස්ථාව ; සහ

(ආ) ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කරන ලද්දා වූ හා මේ වගන්තියෙහි කාර්යයන් සඳහා මුදල් මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ යම් වර්ගයක බැංකු ව්‍යාපාරයක් පවත්වා ගෙන යන්නා වූ යම් සමිතියක්

එයට ඇතුළත් වේ.'.

ප්‍රධාන ප්‍රඥප්තියේ 116 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 116 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"මුදල් ප්‍රතිපත්තිය සහ ආදායම් ප්‍රතිපත්තිය.

116. (1) අයවැය කථාව පිළියෙළ කිරීමේ දී ආධාර කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ මුදල් තත්ත්වය සහ මණ්ඩලයේ තත්කාලීන මුදල් ප්‍රතිපත්තිය විස්තර කරමින් සහ විග්‍රහ කරමින් ද ආණ්ඩුවේ වර්තමාන ආදායම් ප්‍රතිපත්තිය 5 වන වගන්තියෙහි දක්වා ඇති අරමුණු ඉටු කර ගැනීමට මහ බැංකුවට ඇති හැකියාව කෙරෙහි බලපාන අන්දම විභාග කරමින් ද සකස් කළ රහස්‍ය වාර්තාවක් එක් එක් වර්ෂයේ සැප්තැම්බර් මස පහළොස්වන දින හෝ එදිනට පෙර මුදල් මණ්ඩලය විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) ශ්‍රී ලංකා වාසී ජනතාවට උපරිම ප්‍රයෝජනය සැලසෙන ආකාරයෙන් මණ්ඩලයේ මුදල් ප්‍රතිපත්තිය යොමු කර තිබේ ද යන්න පිළිබඳව මුදල් විෂයය භාර අමාත්‍යවරයා සහ මුදල් මණ්ඩලය හා අතර යම් මත භේදයක් පැන නැඟුණු අවස්ථාවක මුදල් විෂයය භාර අමාත්‍යවරයා සහ මණ්ඩලය විසින් තම තමන් අතර එකඟත්වයකට පැමිණීමට ප්‍රයත්න දැරිය යුතුය. මුදල් විෂයය භාර අමාත්‍යවරයාට සහ මණ්ඩලයට එකඟත්වයකට පැමිණීමට නොහැකි වුවහොත්, ආණ්ඩුවේ මතයට අනුකූල වූ ප්‍රතිපත්තියක් මණ්ඩලය

විසින් පිළිගනු ලැබීමේ වගකීම ආණ්ඩුව භාර ගන්නා බව මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් මණ්ඩලය වෙත දැනුම් දිය හැකි අතර එවැනි ප්‍රතිපත්තියක් පිළිගන්නා ලෙස ඔහු විසින් මණ්ඩලයට විධාන කළ හැකි ය. මුදල් විෂයය භාර අමාත්‍යවරයා එසේ විධානයක් කළ අවස්ථාවක මණ්ඩලය විසින් ඒ විධානය පිළිපැදිය යුතු ය.".

116අ වන අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියට ඇතුළත් කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 116 වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය එම ප්‍රඥප්තියේ 116අ වන වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

"වාණිජ බැංකුවල අක්‍රිය අරමුදල් පැවරීම හා පාවිච්චිය.

116අ. (1) යම් වාණිජ බැංකුවක ගිණුමක් අක්‍රියව පවත්නා අවස්ථාවක එනම්, අවස්ථාවෝචිත පරිදි, ඒ ගිණුමෙන් මුදල් ආපසු ගැනීම හෝ ඒ ගිණුමට මුදල් තැන්පත් කිරීම හෝ ඒ ගිණුමට අදාළ පාස් පොත පරීක්ෂා කොට පොලිය ඇතුළු කිරීමට එය ඉදිරිපත් කිරීම හෝ ඒ ගිණුමේ බැරට පවත්නා ශේෂ මුදල ලියවිල්ලකින් ස්ථිර කිරීම හෝ අවුරුදු දහයකට වැඩි කාලයක් තුළ කර නොමැති අවස්ථාවක ඒ ගිණුමේ බැරට පවත්නා මුදල, එකතුවී ඇති පොලියක් වේ නම් එය ද සමග, අන් කිසි නීතියක කුමක් සඳහන් වුව ද, මුදල් මණ්ඩලය විධාන කරන්නේ නම් ඒ වාණිජ බැංකුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ විශේෂ ගිණුමකට මාරු කළ යුතු ය.

මේ උපවගන්තියේ කාර්යයන් සඳහා—

(අ) යම් වාණිජ බැංකුවක ස්ථිර තැන්පතුවක් හෝ කාල තැන්පතුවක් මුලින් කරන ලද්දේ යම් කාලයකට හෝ වාරයකට ද ඒ කාලය හෝ වාරය ගතවීමේ දිනයෙන් පසු අවුරුදු දහයකට වැඩි කාලයක් තුළ කිසිම මුදල් ආපසු ගැනීමක් එම තැන්පතුවෙන් කර නැති විට ඒ ස්ථිර හෝ කාල තැන්පතුව, ඒ වාණිජ බැංකුවේ අවුරුදු දහයකට වැඩි කාලයක් තුළ අක්‍රියව පැවති ගිණුමක් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ආ) වාණිජ බැංකුවෙහි මුලින් තැන්පතුවක් කරන ලද දින සිට අවුරුදු දහයකට වැඩි කාලයක් තුළ කිසිම මුදල් ආපසු ගැනීමක් කර නොමැත්තා වූ ද දැන්වීමකින් පසු ආපසු ගෙවිය යුතු තැන්පතුවක් වූ ද යම් වාණිජ බැංකුවක තැන්පතුවක් ඒ වාණිජ බැංකුවේ අවුරුදු දහයකට වැඩි කාලයක් තුළ අක්‍රියව පැවති ගිණුමක් ලෙස සලකනු ලැබිය යුතු ය; තවද

(ඈ) ගෙවීම සඳහා ඉල්ලුම් කිරීමට හිමිකම් ඇති තැනැත්තකු විසින් ඒ ඉල්ලීම මුලින් ම කළ හැකිව තිබූ දින සිට අවුරුදු දහයකට වැඩි කාලයක් තුළ ඒ ඉල්ලීම කර නැති යම් අණකරයක්, තැපැල් හුවමාරුවක්, ගෙවීම් අණකරයක් හෝ ඒ හා සමාන වෙනත් ලියවිල්ලක් ලබ යම් වාණිජ බැංකුවක් විසින් ගෙවිය යුතු යම් මුදලක් ඒ වාණිජ බැංකුවේ අවුරුදු දහයකට වැඩි කාලයක් තුළ අක්‍රියව පැවති ගිණුමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) තමාගේ නමින් හෝ තමාට අයිතිය ලැබුණේ යම් තැනැත්තකුගෙන් ද ඒ තැනැත්තාගේ නමින් වූ ගිණුමක බැරට පවත්නා මුදල් (1) වන උප වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ විශේෂ ගිණුමකට මාරුකර ඇති බවට ශ්‍රී ලංකා මහ බැංකුව සෑහීමට පත් වන පරිදි සාක්ෂි සපයන යම් තැනැත්තකුට, ශ්‍රී ලංකා මහ බැංකුවේ විශේෂ ගිණුමට ඒ මුදල් මාරු කිරීමට පෙර ඒ මුදල් යම් ගිණුමක බැරට පැවැත්තේ ද ඒ ගිණුමට අදාළ ප්‍රමාණ හා කොන්දේසි අනුව, ඒ මුදල් ගෙවනු ලබන දිනය තෙක් ඒ මුදල් වෙනුවෙන් ගෙවිය යුතු පොලියත් සමග ඒ මුදල් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආපසු ගෙවනු ලැබීමට, යම් ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ ඒ මුදල් සම්බන්ධයෙන් නියම කෙරෙන නියම යන්ට, කොන්දේසිවලට හෝ සීමා කිරීම්වලට යටත්ව හිමිකම තිබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ විශේෂ ගිණුමකට මාරු කරන ලද මුදල් කිසිවක් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසීමෙන් පසු මුදල් මණ්ඩලය විසින් නිශ්චය කළ හැකි යම් කාර්යයන් සඳහා යෙදවිය හැකි ය.".

**121අ සහ 121ආ වන අලුත් වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුලත් කිරීම.**

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 121 වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්ති මෙයින් ඇතුලත් කරනු ලබන අතර ඒ වගන්ති එම ප්‍රඥප්තියේ 121අ සහ 121ආ වන වගන්ති වශයෙන් පිළිවෙළින් බලපැවැත්විය යුතු ය:—

'බැංකු ආයතන නොවන ආයතනවල නම්වල "බැංකුව", "බැංකුකරු" සහ "බැංකු" යන වචන පාවිච්චි කිරීම තහනම් කිරීම.

121අ. මේ පනතෙහි අර්ථානුකූල වූ බැංකු ආයතනයක් නොවන කිසිම ආයතනයක් මුදල් මණ්ඩලයේ ලිඛිත අනුමතය ඇතිව හැර "බැංකුව" යන වචනය හෝ "බැංකුකරු" යන වචනය හෝ "බැංකු" යන වචනය හෝ ඇතුලත් නාමයකින් හෝ නමක් යටතේ පිහිටුවනු ලැබීම හෝ පවත්වාගෙන යනු ලැබීම නොකළ යුතු ය.

මුදල් අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය ඇතිව මිස කිසිම වාණිජ බැංකුවක් පිහිටුවීම, කිසිම වාණිජ බැංකුවක ශාඛාවක් විවෘත කිරීම සහ කිසිම වාණිජ බැංකුවක් විසින් වෙනත් වාණිජ බැංකුවක ව්‍යාපාර කටයුතු අත් කර ගැනීම නොකළ යුතු බව.

121ආ. මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය ලියවිල්ලකින් ලබා නොගෙන—

(1) කිසිම වාණිජ බැංකුවක් ශ්‍රී ලංකාවෙහි නො පිහිටුවිය යුතු ය;

(2) කිසිම වාණිජ බැංකුවක් විසින් එහි යම් ශාඛාවක්, නියෝජිත ආයතනයක් හෝ කාර්යාලයක් ශ්‍රී ලංකාවේ කිසිම කොටසක විවෘත නොකළ යුතු ය; තව ද

(3) කිසිම වාණිජ බැංකුවක් විසින් වෙනත් වාණිජ බැංකුවක ව්‍යාපාර කටයුතු හෝ වෙනත් වාණිජ බැංකුවක යම් ශාඛාවක ව්‍යාපාර කටයුතු හෝ අත් කර නොගත යුතු ය.’.

ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත සංශෝධනය කිරීම.

**14.** ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනතේ 71 වන වගන්තියෙහි “මුදල් නීති පනතේ V වන පරිච්ඡේදයේ II වන කොටස” යන යෙදුම වෙනුවට “මුදල් නීති පනතේ II වන පරිච්ඡේදයේ IVආ වන කොටස” යන යෙදුම ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.